# ගමේ චණ්ඩි ඉස්ටැන්ලි ද සිටියාය !

*පසුගිය කලාපය හා සම්බන්ධයි*

නන්ද මාලිනී සහ සුනිල් ආරියරත්න සුසංයෝජයෙන් මීට වසර විසිතුනකටත් පෙරාතුව 1985 දී බිහිවූ "හේමන්තයේ දී" නම් ගීත එකතුවේ එන "පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය" ගීතයේ එක් පදයක කොටසක් මාතෘකා කර ගනිමින් මා ලියන මේ ලිපියේ සන්නස ජූනි කලාපයේ පළවූ මුල් කොටසේ සාරාංශය මෙසේ ය.

යොවුන් විය පසුකර, ඇන්ජලීන් සහ ජෝතිපාල අතහැර, නන්ද මාලිනී සහ අමරදේව ගී අසන ප්‍රබුද්ධයින් බවට පත්වූ අපි, විශ්ව විද්‍යාල සමයේ දී නන්ද මාලිනී ගේ ගී පිළිබඳ විවිධ සාකච්ඡා සම්මන්ත්‍රණයන් ට සහභාගී වී බුද්ධි මණ්ඩල ප්‍රසාරණය කර ගත්තෙමු. මේ කාලය වන විට "ශ්‍රවන ආරාධනා" වෙන් මිදුණු නන්ද මාලිනිය ද, සුනිල් ආරියරත්න විසින් පබැඳුණු මනරම්, අර්ථ වත් ගී "සත්‍යයේ ගීතය" ප්‍රසංගය තුලින් ඉදිරිපත් කරන්නට පටන් ගෙන තිබුනි. මේ ගීත රසික අපේ කෙතරම් ප්‍රසාදයට ලක් වූව ද, විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ නායකයෙකු වූ සුචරිත ගම්ලත් ගෙන් නම් ලැබුනේ "දෙඃඤ්ඤං බැටේ" ආකාරයේ නිර්දය විවේචන පමණකි. මේ අතර, 1985 දී, නන්ද මාලිනිය හේමන්තයේ දී ගීතාවලිය එලි දැක් වූවාය. මෙහි එන පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය යන ගීතයේ යෙදෙන "ගමේ චණ්ඩි ඉස්ටැන්ලි" යන යෙදුම කවර හේතුවක් මත යෙදූවක් දැයි මා සිත තුල දැඩි කුතුහලයක් ඇති කළ අතර, මගේ එක් සමීපතම මිතුරෙකු ගේ නම ද ස්ටැන්ලි වූ නිසා මේ ගීතය ගැන අප අතර වැඩි උනන්දුවක් ද ඇතිවිය.

ටික දිනකට පසු අපට අසන්නට ලැබුනේ නන්ද මාලිනිය ගේ ගී පිළිබඳව සම්මන්ත්‍රණයක් මහනුවර දී පැවැත්වෙන බවයි. මෙය ඊට වසර හතරකට පෙර "නන්ද-සුනිල්" ගී ප්‍රතිගාමී ගී බවට නිර්දය ලෙස විවේචනය කළ සුචරිත ගම්ලත් ගේ නායකත්වය යටතේ විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය විසින් සංවිධානය කෙරෙන බව අසා අප පුදුමයට පත්වීමු. කෙසේ වූවද, මෙය මගේ "ගමේ චණ්ඩි ඉස්ටැන්ලි" පිළිබඳ ගැටළුව නිරාකරණය කරගැනීමට ලැබුණු අපූරු අවස්ථාවක් නිසා මිතුරන් ද සමග මම එහි ගියෙමි.

අද එතැන් සිට.

අද "සමාජ සමානතා පක්ෂය" නමින් ක්‍රියාත්මක වෙන එවකට විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය හෙවත් "විකොස" නමින් හැඳින්වුනු කණ්ඩායම, ඉතා සීමිත නමුත් මනා ලෙස තම දේශපාලන දර්ශනය දන්නා සාමාජික පිරිසක ගෙන් සමන්විත විය. මේ කාලය වන විට ඔවුනට විශ්ව විද්‍යාලය තුල සැලකිය යුතු පිරිස් බලයක් නොතිබුනි. නමුත් මින් දෙවසරක ට පමණ පසු කාලයක පක්ෂය සඳහා පූර්ණකාලීනයින් ද ඉංජිනේරු පීඨ සිසුන් අතරින් බඳවා ගැනීමට ඔව්හු සමත් වූහ. විකොස අයත් වූයේ හතරවන ජාත්‍යන්තරයටයි. ඔවුන් ට ඉතා හොඳ අන්තර්ජාතික සම්බන්ධතා තිබුනි. ඇතැම් විට මුදල් ආධාර ද ලැබුනා විය හැක. ඔවුන් ගේ නායක කේඩරයන් වූ කීර්ති බාලසූරිය, විජේ ඩයස්, සුචරිත ගම්ලත් සහ පියසීලි විජේගුණසිංහ යනාදීහු උගතුන් මෙන්ම බුද්ධිමතුන් ද වූහ.

දේශපාලනික වශයෙන් ඒ දිනවල ඔවුන් ගේ ප්‍රධාන වෙනස වූයේ ජනවාර්ගික ප්‍රශ්ණයේ දී දෙමල ජනතාව ගේ ස්වයං-නීර්ණ අයිතිය වෙනුවෙන් සෑම විටකම පෙනී සිටීමයි. "ජාතිවාදී යුද්ධයට එක ඉත්තෙක් හෝ එක රුපියලක් හෝ නොදෙනු" යන්න මෙහිදී ඔවුන් ගේ ප්‍රධාන සටන් පාඨය විය. මෙය ඔවුන් ගේ නිල ප්‍රකාශනය වන කම්කරු මාවත පුවත් පතේ මුඛ්‍ය පාඨය වූ බව මගේ මතකයයි. මෙය ඉතා අගනා අදහසක් ගැබ් වී තිබූවක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. යුද්ධයේ ඉත්තෝ වනාහී දෙපසින් යුධ වදින බටයෝ වූහ. රුපියලක් නොදෙනු යැයි සිංහලෙන් ලිවීමේ දී අදහස් වූයේ ජාතික ආරක්ෂක අරමුදල ය මුදල් දීම පිළිබඳවයි. විකොස දෙමළෙන් ද "තෝරිලාල් පාතෙයි" වැනි නමකින් යුතු පුවත් පතක් ප්‍රකාශනය කළහ. විකොසේ, මේ සටන් පාඨය සැසඳිය යුත්තේ ඒ වන විට තහනම් සංවිධානයක් වූ ජනතා විමුක්ති පෙරමුණේ එකල සටන් පාඨය වූ "ජාතිවාදීන්ට කප්පම් නොදෙනු,

> **.....විකොසේ සුචරිත ගම්ලත් හා පියසීලි විජේගුණසිංහ මේ කලා විචාර ක්‍රමවේදය ගැන පොත් පත් කිහිපයක් ම ලියා ඇත. ඔවුන් දෙදෙනා සිංහල භාෂාව, කලාව සහ සාහිත්‍යය පිළිබඳව විශාරදයෝ වූහ. නසසපයේ එවැනි අය එවකට ප්‍රකටව නොසිටිය බව කිව හැක. වසර ගණනාවක් තිස්සේ සිංහල තීරු ලිපි වලින් අප දැනුවත් කරමින් සිටියද, බාහු පවා තමන්ගේ කලාව පිළිබඳ ව වූ අක්‍රුපත්‍ර එළිදැක්වූයේ මේ 2008 ජූනි මාසය තරම් මෑත කලෙකදී පසුගිය සන්නස කලාපයේ පළවූ ඔහුගේ තීරු ලිපියෙනි.**

ජනතාවට අයිතීන් දෙනු" යන්න සමග ය. විජේවීර ගේ ජාතික ප්‍රශ්ණය ට විසඳුම කුමක් ද කෘතියේ සහ එවකට ප්‍රචලිතව තිබූ ඔහුගේ කැසට් කතා අනුව යමින් ජවිපෙ මෙම සටන් පාඨයෙන් අදහස් කළේ "දෙමල සටන්කාමීන් සමග සාකච්ඡා වලට නොයනු, ආණ්ඩුව ඉල්ලා අස්වෙනු" වැනි දෙයක් විය යුතු බව අපට නිගමනය කළ හැකිවිය.

මා පසුගිය සතියේ ද සඳහන් කළ පරිදි, විකොස හා බොහෝ දුරට සමාන දේශපාලන ප්‍රතිපත්ති දැරූ නව සම සමාජ පක්ෂය හෙවත් නසසපය, විකොසේ ප්‍රධාන දේශපාලනික හතුරා විය. ඒ මේ දෙගොල්ලෝ ම "හතර වෙනි ජාත්‍යන්තරය" නියෝජනය කළ නිසා විය හැක. නසසපය එවකට වාසුදේව ගේ ජනප්‍රිය නායකත්වයෙන් සහ වික්‍රමබාහු ගේ මතවාදී නායකත්වයෙන් පැවතුනි. අප දන්නා පරිදි, ධනපති ආණ්ඩුව හා සහාග-ගත වීමට වාසුදේව නසසපයෙන් ඉවත් වූයේ මින් වසර දශයකට පමණ පසුවය. විශ්ව විද්‍යාලය තුල නසසප සාමාජිකයින් කිහිප දෙනෙක් සිටියහ. එහෙත් එය සමහර විට 1978 පමණ පැවති තත්වයේ නෂ්ඨාවශේෂයක් පමණක් බව සිතමි.

කම්කරු මාවත පුවත් පත විකොසයේ නිල ප්‍රකාශනය වූවද, නසසපය "හරය" නම් පුවත් පතක් ප්‍රකාශනය කළේ නිල නොවන මට්ටමෙනි. කම්කරු මාවතේ ලිපි වල ද, විකොස නායකයින් ගේ කතාවලද අනිවාර්‍යයෙන්ම නසසපයට දේශපාලනමය වශයෙන් පහර එල්ල කිරීම ද, හරය පුවත් පතට සරදම් කිරීමද සිදු කෙරිණ. හරය පුවත් පත නිරතුරුවම හැඳින්වුනේ "පත්තර කඩමාල්ල" වැනි පරිභවාත්මක පදයකින් බව මගේ මතකයයි. ඒ සමගම විකොසේ, ඒ සෑම ලිපියක් ම, සෑම කතාවක් ම අවසාන වූයේ මේ සියළු ප්‍රශ්ණ වලට පිළිතුර ලෙස විකොසට බැඳෙන ලෙස කෙරෙන ඇරයුමකිනි. අද ද ඔවුන් ගේ ලිපි හෝ කතා හෝ අවසාන වන්නේ සමාජ සමානතා පක්ෂයට බැඳෙන ලෙස කෙරෙන ඉල්ලීමකින් යැයි සිතමි.

කලා කෘති විවේචනයේ දී ද විකොස අනුග මනය කළේ සමාජවාදී ක්‍රමවේදයකි. විකොසේ සුචරිත ගම්ලත් හා පියසීලි විජේගුණසිංහ මේ කලා විචාර ක්‍රමවේදය ගැන පොත් පත් කිහිපයක් ම ලියා ඇත. ඔවුන් දෙදෙනා සිංහල භාෂාව, කලාව සහ සාහිත්‍යය පිළිබඳව විශාරදයෝ වූහ. නසසපයේ එවැනි අය එවකට ප්‍රකටව නොසිටිය බව කිව හැක. වසර ගණනාවක් තිස්සේ සිංහල තීරු ලිපි වලින් අප දැනුවත් කරමින් සිටියද, බාහු පවා තමන්ගේ කලාව පිළිබඳ ව වූ අක්‍රුපත්‍ර එළිදැක්වූයේ මේ 2008 ජූනි මාසය තරම් මෑත කලෙකදී පසුගිය සන්නස කලාපයේ පළවූ ඔහුගෙ තීරු ලිපියෙනි.

සුචරිත ගම්ලත් ගේ සහ පියසීලි විජේගුණසිංහ ගේ සාහිත්‍ය විචාර කෘති වල දී ඔවුන් භාවිතා කර තිබූ දෘඪ රචනා විලාසය සහ මහප්‍රාණ වදන් වැල නිසාදෝ ඒ කෘති කියවා වටහා ගැනීමට අප බොහෝ දෙනෙකු අපොහොසත් වූවද, විටින් විට අප අතට පත්වෙන කම්කරු මාවතේ ලිපි කියවා අපි, ලංකාවේ "බැංකු සේවක සංගමය සහ ටී. එම්. නිහිෂාන්" ලා ගැන පමණක් නොව, අන්තර්ජාතික "මයික් බණ්ඩ ලා, හීලි ලා සහ ස්ලේටර්" ලා ගැන ද දැන ගත්තෙමු.

මුලින් කී පරිදි, සති අන්තයේ පැවති සම්මන්ත්‍රණයට ස්ටැන්ලි ද තවත් මිතුරන් ද සමග මම සහභාගී වීමි. මෙහිදී මුලින් කතා කළ සුචරිත ගම්ලත්, තමන් සුනිල් ආරියරත්න විසින් පබැඳුනු, නන්ද මාලිනිය ගේ ගී පිළිබඳව මින් පෙර නිර්දය විවේචන ඉදිරිපත් කළ බව නිර්ව්‍යාජව සිහි කළේය. නමුත් අද වෙන විට මේ දෙපල ගේ සුසංයෝග යෙන් නිර්මාණය වන ගීත පෙර ගත් ප්‍රතිගාමී මගින් මිදී, සැබෑ ජනතාවාදී ස්ථාවරයක් ගෙන ඇති බව ඔහු මනාව විස්තර කළේය. විකොස සම්ප්‍රදය අනුව යමින් සුපුරුදු පරිදි නසසපය ට ත්, නසසප යේ නිල ප්‍රකාශනය වන පත්තර කඩමාල්ල ලෙස ඔහු හැඳින්වූ හරය පුවත් පතටත් පහර ගැසූ සුචරිත ගම්ලත් හු, රටේ සියළු ප්‍රශ්ණ වලට විසඳුම සෙවීම ආරම්භ කළ හැක්කේ විකොසට බැඳීමෙන් බව පවසමින් තම දේශණය අවසාන කළහ.

මෙහිදී හෙළිදරව් වුනු කාරණයක් වූයේ ගම්ලත් සහ ආරියරත්න දෙපල අතර ගුරු-ගෝල සම්බන්ධයක් නො තිබුන ද, ඔවුන් දෙදෙනාම යාපනය සරසවියේ, සිංහල භාෂා අංශයේ, ආචාර්ය මණ්ඩලයේ එකට සේවය කර ඇති බවයි. සිනමාකරු ධර්මසේන පතිරාජා ද මේ දිනවලම යාපනය සරසවියේ සේවය කළා යැයි සිතමි.

> **සුචරිත ගම්ලත් ගේ ශරීර ආරක්ෂකයා ළෙස ඔහු විසින් ඊට මාසයකට පමණ පෙර ඉංජිනේරු පීඨ කැන්ටිමේ දී ස්ටැන්ලිටත් මටත් හඳුන්වා දුන් මැර පෙනුමකින් යුතු වූ තරුණයා මුළු සභාවට ම තර්ජනය කරමින් ශාලාව මැදින් උඩටත් පහලටත් දිව ගියේ ය. මහා ගාල-ගෝට්ටියක් ඇරඹිණ. නන්ද මාලිනිය පෙරටු කොටගත් සුනිල් ආරියරත්න වේදිකාවේ බිහි දෙරින් නික්ම යනු පෙනුණි. සාහිත්‍ය සම්මන්ත්‍රණය එතැනින් ම නිමා විය. මගේ ගමේ චණ්ඩි ඉස්ටැන්ලි පිළිබඳ වූ සාහිත්‍යමය ගැටළුවට......**

තම දේශණයේ දී ඒ අතීතය සිහිපත් කළ සුනිල් ආරියරත්නයෝ ද, වරෙක තමා ලියූ එක් ගීයක් සුචරිත ගම්ලත් ට පෙන්වූ හැටිත් එහි වූ එක් පදයක් වන "සිරිලක සතර දිසා එක හීයයි" යන්න ගැන විවේචනයක් කළ ගම්ලත් හු කිඹුලා ලකුණ දරණ උදැල්ලක් රටේ බේතකටවත් සොයාගන්නට බැරි කාලයක (ඒ සමගි පෙරමුණ රජය සමයයි) සිරිලක සතර දිසාවම එක හීයක් යැයි කීම මහා වංචාවක් බවට දෙස් නැගූ බවත් සභාවේ සිනා හඬ මැද සිහි කළහ.

අවසන එලැඹියේ සාකච්ඡා වාරයයි. සභාවේ ප්‍රශ්ණ වලට මහැදුරු දෙපල පිළිතුරු දෙන්නට සැදී පැහැදුනහ. කලින් සැලසුම් කර සිටියාක් මෙන්ම "ගමේ චණ්ඩි ස්ටැන්ලි" පිළිබඳ පැණය අසන්නට මා නැගී සිටියෙමි. නමුත් ඒ වන විටත් වෙනත් අයෙක් නැගිට වේදිකාව දෙසට යමින් සිටියේ ය. ඒ සභාවේ සිටි තවත් විශ්ව විද්‍යාල සිසුවෙකි. මා ඔහු මෙහිදී යසස් නමින් හඳුන්වමි. යසස් ගෙන් පසු වාරය මට ලබා ගැනීමට සිතා මා නැවත අසුන් ගතිමි.

යසස් යනු නිකම්ම නිකං විශ්වවිද්‍යාල සිසුවෙකු නොව සුවිශේෂී පුද්ගලයෙක් විය. ඒ ඔහු ගේ දේශපාලන සබඳතා නිසාය. ඒ මදිවාට ඔහු සරසවියේ උගත්තේ ද දේශපාලන විද්‍යාවයි. මා ඔහු හඳුනාගත්තේ අප දෙදෙනාම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරි කමිටුවේ සාමාජිකයින් වූ නිසාය. වාමාංශිකයෙක් වූ යසස් නසසපය සමග සම්බන්ධතා පැවැත්වූවෙකි. කොටින් ම ඉංජිනේරු පීඨ සමාජ විද්‍යා සංගමය මගින් සංවිධානය කරන ලද "ජාතික ප්‍රශ්ණයට විසඳුම කුමක් ද?" නම් වූ දේශණය පැවැත්වීම සඳහා නසසප න්‍යායාචාරී බාහු ට අපේ ආරාධනාව යවන ලද්දේ ද යසස් අතේ ය.

දේශකයන් ගෙන් පැණයක් ඇසීමට යසස් සම්මන්ත්‍රණ වේදිකාවට නගිනු අපි බලා සිටියෙමු. මයික්‍රොෆෝනය අසලට ගිය ඔහු කියා සිටියේ තමන් පැමිණියේ ප්‍රශ්ණයක් ඇසීමට නොව යම් පැහැදිලි කිරීමක් සිදු කිරීමට බවයි. ඒ පැහැදිලි කිරීම වූයේ හරය යනු නසසපයේ නිල පුවත්පත නොවන බවය. ඒ සමගම, නසසපය පිළිබඳව සුචරිත ගම්ලත් විසින් කළ සරදම් වලට යම් ආකාරයක කෙටි පිළිතුරක් දීම ද යසස් අතින් සිදුවුණු බව මගේ මතකයයි.

සභාවේ සිටි ඇතැම් පිරිස් අත් පොළසන් නැගූහ. ඒ සමගම, වේදිකාවේ ද, සභාවේ ද සිටි විකොස කොටස් (එනම්, විකොස ක්‍රියාකාරිකයින්), කළබලයෙන් නැගිට්ටහ. සුචරිත ගම්ලත් ගේ ශරීර ආරක්ෂකයා ළෙස ඔහු විසින් ඊට මාසයකට පමණ පෙර ඉංජිනේරු පීඨ කැන්ටිමේ දී ස්ටැන්ලිටත් මටත් හඳුන්වා දුන් මැර පෙනුමකින් යුතු වූ තරුණයා මුළු සභාවට ම තර්ජනය කරමින් ශාලාව මැදින් උඩටත් පහලටත් දිව ගියේ ය. මහා ගාලගෙ ෝට්ටියක් ඇරඹිණ. නන්ද මාලිනිය පෙරටු කොටගත් සුනිල් ආරියරත්න වේදිකාවේ බිහි දෙරින් නික්ම යනු පෙනුණි. සාහිත්‍ය සම්මන්ත්‍රණය එතැනින් ම නිමා විය. මගේ ගමේ චණ්ඩි ඉස්ටැන්ලි පිළිබඳ වූ සාහිත්‍යමය ගැටළුව ට විසඳුමක් නොලැබුණි.

කෙසේ වෙතත් එකක් කීමට ඇත. හරය පුවත් පත නසසපයේ නිල පුවත්පත නොවන බව යසස් කියූ වේලේ මම එය විශ්වාස නො කළෙමි. එය අර්ධ සත්‍යයක් පමණක් විය යුතුය. අද ද ඔබ නසසපයේ වෙබ් අඩවියට පිවිසුනහොත් හරය පුවත් පතේ අන්තර්ජාල සංස්කරණයක් එහි දකින්නට ලැබේ. එකම වෙනස නම් අද නසසපය වෙනුවට එම වෙබ් අඩවිය හැඳින්වෙන්නේ වාමාංශික පෙරමුණ යන නමින් වීමයි. එනමුදු, නසසපය පෙර ලෙසම ක්‍රියාකාරීණීබවත්, වාමාංශික පෙරමුණ යනු ඡන්ද වැඩ සඳහා පිහිටුවාගත් සංවිධානයක් බවත්, හරය යනු එදත් අදත් නසසපයෙන් පිටස්තරයන් පවා සම්මාදන් වෙන පොදු පුවත් පතක් බවත් බාහු මගේ විමසුමට පිලිතුරු ලෙස පැවසූවේය.

ඒ සමගම අද විකොස නොහොත් එහි අනුප්‍රාප්තික සමාජ සමානතා පක්ෂයෙන් බාහිරව ක්‍රියාත්මක වෙන සුචරිත ගම්ලත් ද, නසසපය නැත්නම් වාමාංශික පෙරමුණේ නායකත්වය දරණ බාහු ද අතර ගීත මුලික කොටගෙන දේශපාලන විවාද අද ද ඇතිවේ. ඔවුන් අතර මේ දිනවල කෙරෙන විවාදය නම් කම්කරු පන්තියට මනාව තේරුම් ගත හැකි වන පරිදි කුමරියක පා සලඹ සැළුනා වැනි ගීත නැවත ලිවිය යුතුද යන්නයි. මේ පිළිබඳව උනන්දුවක් දක්වන්නෝ ඉරිද සිංහල පුවත්පත් බලත්වා!

ර. චන්ද්‍රසූරිය විසිනි
ra.chandra.suriya@gmail.com

